සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

පළාත්

# සමාජ විද්‍යා දැනුම මිනුම තරඟය - 2019

## 09 ශ්‍රේණිය

කාලය පැය - 01 යි මිනිත්තු 30

නම - .................................................. කොට්ඨාශය - ..................................................

පාසල - .................................................. පාසල් කාණ්ඩය - ..................................................

❖ ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලදී නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ශ්‍රී ලංකාවට පැමිණි මුල්ම ලන්දේසි ජාතික ජොරිස් වෑන් ස්පිල්බර්ජන් ඇතුළු නැව් කණ්ඩායම මෙරටට පැමිණෙන විට උඩරට පාලකයා වූයේ.
   i. පළමුවන රාජසිංහ රජතුමාය
   ii. පළමුවන විමලධර්මසූරිය රජතුමාය
   iii. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාය
   iv. සේනා සම්මත වික්‍රමබාහු රජතුමාය

2. ක්‍රි.ව. 1803 ෆෙඩ්රික් නොර්ත් ආණ්ඩුකාර වරයා විසින් කන්ද උඩරට ආක්‍රමණයට යෙදවූ හමුදා ප්‍රධානියා වූයේ
   i. හජී මරික්කාර් ය
   ii. ජෝන් ඩොයිලි ය
   iii. මැක්ඩොවල් ය
   iv. තෝමස් මෙට්ලන්ඩ් ය

3. ලෝකයේ පිහිටි සානු අතරින් වඩා උසින්ම පිහිටි සානුව මින් කුමක්ද?
   i. පාමීර් සානුව
   ii. ටිබෙට් සානුව
   iii. ඩෙකෑන් සානුව
   iv. සයිබීරියන් සානුව

4. ආසියාවේ ඉහළම උෂ්ණත්වයක් වාර්තාවන නගරය වන්නේ
   i. ජකෝබාබාද් ය
   ii. හයිද්‍රාබාද් ය
   iii. වර්කොයැන්ස්ක් ය
   iv. කරච්චි ය

5. පහත වැරදි අතරින් අපරාධ නීතියට අයත් වරදක් ලෙස දැක්විය හැක්කේ
   i. විවාහ ගිවිසුම් කඩ වීමයි.
   ii. ළමා අපයෝජනයි
   iii. දේපළ උරුමය සම්බන්ධ නඩුය
   iv. මානව අයිතිවාසිකම් කඩවීමය (ලකුණු 2 x 5)

❖ ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

6. 1815 වර්ෂයේ ඉංග්‍රීසීන් විසින් කන්ද උඩරට ආක්‍රමණය කිරීමේ දී සිංහල රජු පරාජය වීමට බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ රජ හා රදල ප්‍රධානීන් අතර මත භේද ඇතිවීමයි. ඒ මතභේදය ඇතිවීමට බලපෑ ප්‍රධානම හේතුවක් වන්නේ
   i. දළදා මළිගාව අවට නවීකරණය කිරීමේදී භික්ෂූන් වහන්සේලාගේ උපදෙස් නොගැනීම
   ii. පරණගම කුඩා ස්වාමීන් වහන්සේ ඇතුළු භික්ෂු ඝාතනය සිදුවීම
   iii. රජු විසින් ක්‍රියාත්මක කළ කෲර දඬුවම් ක්‍රම
   iv. රදළ වරුන්ට පැවරී තිබූ රාජකාරිය තම ඥාතීන් වූ නායක්කර් වංශිකයන්ට පැවරීම

7. 1840 බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් මුඩුබිම් පනත නිසා මෙරට ජන සමාජයේ ඇති වූ ප්‍රධාන වෙනස අයත් පිළිතුර වන්නේ

i. ඉඩම් වල අයිතිය සනාථ කිරීමට නොහැකි වීම
ii. වී වගාව අඩපණ වීම
iii. ඉඩම් අහිමි ජනකොට්ඨාසයක් බිහිවීම
iv. කඳුකර ප්‍රදේශවල වතුවගා ව්‍යාප්ත වීම

8. කාර්මික රටක් වන ජපානයේ ප්‍රධානතම කර්මාන්තය ක්ෂේත්‍රය කුමක්ද?

i. මෝටර් රථ කර්මාන්තයයි
ii. සැකසූ ආහාර නිෂ්පාදනයයි
iii. ප්ලාස්ටික් කර්මාන්තයයි
iv. ඉලෙක්ට්‍රොනික් හා විදුලි උපකරණ නිෂ්පාදනයයි

9. ශ්‍රී ලංකාවේ සංවර්ධනය සම්බන්ධයෙන් වඩාත් ගැළපෙන පිළිතුර පහත පිළිතුරු අතරින් තෝරන්න.

i. ශ්‍රී ලංකාවේ ආයු අපේක්ෂාව ඉහළ අගයක් ගැනීම
ii. ඇතැම් ප්‍රදේශවල ජනගහනය අඩු අතර නාගරික ප්‍රදේශවල ජනාධික වීම
iii. ළදරු මරණ අනුපාතය පහළ වැටීම
iv. ප්‍රාදේශීය වශයෙන් සංවර්ධන මට්ටම් වල වෙනස්කම් පැවතීම

10. සමාජ සුරක්ෂිතතාවය යන්නට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

i. විවිධ නීතිරීති මඟින් සමාජ සුරක්ෂිතතාවය තහවුරු කළ හැකි වීම.
ii. සෑම පුද්ගලයෙකුට යහපත්ව ජීවත් වීමට සමාජයෙන් ලැබෙන රැකවරණය
iii. විවිධ ආයතන සමාජ සුරක්ෂිත භාවය තහවුරු කිරීමට කටයුතු කිරීම
iv. තමාගේ ආරක්ෂාව තමා විසින්ම සපයා ගැනීම.

(ලකුණු 2 x 5)

❖ අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වල හිස්තැනට ගැළපෙන පිළිතුර ලියන්න.

11. ලන්දේසි පාලන සමයේ ආගම ප්‍රචාරය කිරීම සඳහා .................................................. නම් ආයතන විශේෂයක් පිහිටවනු ලැබීය.

12. ක්‍රි.ව. 1900 දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීමට .................................................. ආණ්ඩුකාරවරයා කටයුතු කිරීම, කෘෂිකාර්මික අංශයේ වැදගත් අවස්ථාවකි.

13. ඉන්දියාව, ලංකාව, මියන්මාරය වැනි රටවල් .................................................. නම් වූ දේශගුණික කලාපයට අයත් වේ.

14. රටක ක්‍රියාත්මක වන ඉහළම නීති පද්ධතිය .................................................. ලෙස හැඳින්වේ.

15. අනාගත පරපුර සඳහා සම්පත් ඉතිරිවන ආකාරයට වර්තමාන සංවර්ධනය සැලසුම් කිරීම .................................................. ලෙස හැඳින්වේ.

(ලකුණු 2 x 5)

❖ ප්‍රශ්න අංක 16 සිට 25 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

16. ක්‍රි.ව. 1602 දී ජොරිස් වැන් ස්පිල්බර්ජන් නැමති ලන්දේසි නැව් කණ්ඩායම පැමිණීමෙන් පසු මෙරටට පැමිණි දෙවන ලන්දේසි දූත කණ්ඩායම් ප්‍රධානියා කවුද? ..................................................

17. ක්‍රි.ව. 1818 නිදහස් සටනට හේතු වූ ඌව වෙල්ලස්ස ප්‍රදේශයට පත්කළ මුස්ලිම් මුහන්දිරම් වරයා නම් කරන්න.

..................................................


18. මුහුද දෙසට නෙරා ගිය ප්‍රතිරෝධී පාෂාණ සහිත ගොඩබිම් ප්‍රදේශය හඳුන්වන නම කුමක්ද?

..................................................

19. අවුරුද්දේ නිශ්චිත කාලයකදී ගොඩබිම හරහා හමන සුළං මඟින් ඇතිවන වර්ෂාපතන වර්ගය සඳහන් කරන්න.

..................................................

30.



i. මෙම රූපය නම් කරන්න. ..............................

ii. මෙය පිහිටි කඳුපන්තිය කුමක්ද? ..............................

❖ ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න. (ලකුණු 4 x 5 )

31. i. ශ්‍රී ලංකාවේ වැඩිම භූමි ප්‍රමාණයක් ආවරණය වන දේශගුණික කලාපය නම් කරන්න.

..............................

ii. මෝසම් වර්ෂාව හැර ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන අනෙක් ප්‍රධාන ක්‍රම දෙක නම් කරන්න.

.............................. ..............................

32. i. වැඩ ලෝකය යනු කුමක්ද? ..............................

ii. කෘෂි කාර්මික අංශය හැර වර්තමාන රැකියා වෙළඳපොලේ පවතින අනෙක් ක්ෂේත්‍ර දෙක නම් කරන්න.

.............................. ..............................

33. i. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ස්වරූප දෙක ඇසුරින් වර්තමානයේ ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය කුමක්ද? ..............................

ii. ප්‍රජාතන්ත්‍ර වාදය පිළිබඳ අදහස් දැක්වූ විද්වතුන් දෙදෙනෙක් නම් කරන්න.

.............................. ..............................

34. i. "සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩ නැඟීම" මූලික දැක්ම කරගත් සමාජ සුරක්ෂිත භාවය සඳහා කටයුතු කරන ආයතනය නම් කරන්න. ..............................

ii. සමථ මණ්ඩලය වෙත ආරවුලක් යොමු කළ හැකි ක්‍රම දෙකක් නම් කරන්න.

.............................. ..............................

35. i. ලංකාවේ ලන්දේසි සතු වූ මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසින්ට භාර දෙන ලෙස දන්වන ලද ලිපිය කුමක්ද?

..............................

ii. කන්ද උඩරට අල්ලා ගැනීම සඳහා සටන් මෙහෙය වූ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරු දෙදෙනෙක් නම් කරන්න.

.............................. ..............................

(ලකුණු 4 x 5 )

❖ ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා දී ඇති ස්ථාන සපයා ඇති ලංකා ආකෘති සිතියමේ නිවැරදිව ලකුණු කොට නම් කරන්න.

36. මල්වතු ඔය

37. මහනුවර

38. දෙවුන්දර තුඩුව

39. මන්නාරම් දූපත

40. උඩවලවේ ජලාශය

(ලකුණු 2 x 5 )

20. සමූපකාර ව්‍යාපාරය ආරම්භ වූයේ ණය දෙන සමිති ලෙසිනි. එසේ ලංකාවේ ආරම්භ වූ මුල්ම සමූපකාර සමිතිය කුමක්ද? ..............................................................................................

(ලකුණු 2 x 5)

❖ අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න වලට "අ" සහ "ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවායේ සම්බන්ධතාවය අනුව නිවැරදිම ගලපා ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

21.

| අ | ආ |
|---|---|
| i. බදු එකතු කිරීමට අමිල්දාර්වරු පත් කිරීම | A. ඉංග්‍රීසින් කන්ද උඩරට අත්පත් කර ගැනීම |
| ii. ජෝන් ඩොයිලිගේ උපායශීලී ක්‍රියා පිළිවෙල | B. පළමු නිදහස් සටන |
| iii. 1815 ගිවිසුමේ කොන්දේසි කඩ කිරීම | C. මදුරාසි පාලනය |
| iv. මුඩුබිම් පනත | D. දෙවන නිදහස් සටන |

i. C A B D    ii. A D B C    iii. C A D B    iv. D A C B

22.

| අ | ආ |
|---|---|
| i. පහත රට තෙත් කලාපීය වනාන්තර | A. අඹේවෙල |
| ii. පහතරට වියළි කලාපීය වනාන්තර | B. සමනල කන්ද |
| iii. කඳුකර තෙත් කලාපීය වනාන්තර | C. විල්පත්තුව |
| iv. කඳුකර වියළි කලාපීය වනාන්තර | D. සිංහරාජය |

i. D C B A    ii. B C A D    iii. D B C A    iv. A B D C

23.

| අ | ආ |
|---|---|
| i. ඉන්දියාව | A. තිම්පු |
| ii. නේපාලය | B. දිල්ලිය |
| iii. භූතානය | C. ඉස්ලාමාබාද් |
| iv. පාකිස්ථානය | D. කත්මණ්ඩු |

i. B C A D    ii. A C B D    iii. B D A C    iv. C B D A

24.

| අ | ආ |
|---|---|
| i. කුළුගල් සහිත වන අතර කර්කශ දේශගුණයක් ඇත. | A. කඳුකර කලාපය |
| ii. මාර්ග වංගු සහිතය. නිවාස උසින් අඩුව ඉදිකෙරේ. | B. වියළි කලාපය |
| iii. භූ විෂමතාව අනුව සැකසූ වැව් පද්ධතියක් දක්නට ලැබේ. | C. තෙත් කලාපය |
| iv. අධික ජනාවාසකරණයක් මෙන්ම දියුණු මාර්ග පද්ධතියක් දක්නට ලැබේ. | D. යාපන අර්ධද්වීපය |

i. D A B C    ii. C B A D    iii. D A C B    iv. B D A C

25.

| අ | ආ |
|---|---|
| i. එදිනෙදා කටයුතු වලදී සාමූහිකව කටයුතු කිරීම | A. දේශීය නිෂ්පාදනය |
| ii. උරුමයෙන් ලැබුණු හා පුරුදු පුහුණු කරගත් දෙය ගුණාංග රැසක් සහිතව ජීවත් වීම | B. දේශීය සංස්කෘතිය |
| iii. සෑම රටට ආවේණික උරුමයන් [illegible] | C. සහජීවනය |
| iv. [illegible] | D. යහජීවනය |

i. C B A D    ii. A C B A    iii. B D A C    iv. C D B A

(ලකුණු 2 x 5)

❖ ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.


26.



i. මෙම රූපයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න. ..............................................................................

ii. මෙතුමා හඳුන්වන අන්වර්ථ නාමය කුමක්ද? ..............................................................................

27.



i. මෙම පින්තූරයේ දැක්වෙන පුද්ගලයා නම් කරන්න. ..............................................................................

ii. මෙතුමා ලොවට හඳුන්වා දුන් දායාදය කුමක්ද? ..............................................................................

28.



i. මෙම රූපය නම් කරන්න. ..............................................................................

ii. මෙය කුමන බටහිර ජාතියට අයත්ද? ..............................................................................

29.



i. මෙම ස්ථානය නම් කරන්න. ..............................................................................

ii. මෙම ස්ථානයේදී සිදුවූ ශ්‍රී ලංකාවේ වැදගත් ඓතිහාසික සිද්ධිය නම් කරන්න. ..............................................................................

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**